www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ආන්ඩුව විරුද්ධ අපේක්ෂකයා නුසුදුස්සෙකු කිරීමට තර්ජනය කරයි

## Sri Lankan government threatens to disqualify opposition candidate

**කේ. රත්නායක විසිනි**

**2010 ජනවාරි 27**

ආන්ඩුව ජනාධිපතිවරනයෙන් පසුව, විරුද්ධ අපේක්ෂක ජෙනරාල් සරත් ෆොන්සේකා නුසුදුස්සෙකු කිරීම පිනිස නීතිමය පියවර ගන්නා බවට තර්ජනය කිරීමත් සමඟ කටුක නීතිමය හා ව්‍යවස්ථාමය අර්බුදයක තර්ජනය වැඩිවී තිබේ. ආන්ඩුවේ නීතිමය අභියෝගය හිස එසවූයේ ඡන්ද හිමි නාම ලේඛනයේ නම ඇතුලත්ව නොතිබීම නිසා ඔහුට ඡන්දය පාවිච්චි කල නොහැකිවූ බව හෙලිවීමෙන් පසුවය.

2008 ඡන්ද නාම ලේඛනයට සිය නම ඇතුල් කල ද එය ලේඛනගතව නොමැති බව ෆොන්සේකා අවධාරනයෙන් කියා සිටියේය. "යමෙකුගේ නම ඡන්ද ලේඛනයට ඇතුලත්ව නොතිබීම අපේක්ෂකයෙකු වීමට නුසුදුසු කමක් නොවේ" යයි මැතිවරන කොමසාරිස් දයානන්ද දිශානායක මාධ්‍ය වෙත ප්‍රකාශ කලේය. කෙසේ වුව ද විදේශ ඇමති රෝහිත බෝගොල්ලාගම ප්‍රකාශ කලේ "මේ අපේක්ෂකයා අපේක්ෂකයෙකු ලෙස ප්‍රකාශ කිරීම සඳහා සුදුසුකම් ලබා නොමැති බැවින් අපි ඔහුගේ සුදුසුකම් පරීක්ෂා කිරීමට අධිකරන නියෝගයක් ලබා ගැනීමට කටයුතු කරන්නෙමු" යනුවෙනි.

බලයේ සිටින ජනාධිපති මහින්ද රාජපක්ෂ හෝ ෆොන්සේකා හෝ ඡන්ද ප්‍රතිපලය නිහඬව පිලිගැනීමට සූදානම් නැති බවට මෙම මතභේදය තවත් ඇඟවුමකි. හමුදාව පසුගිය මැයි මාසයේදී එල්ටීටීඊය පරාජය කිරීමෙන් පසුව පැවැත්වූ කටුක ලෙස තරගවැදි මැතිවරනය, පාලක පන්තියේ තියුනු විරසකයන් එලිමහනට ගෙනැවිත් තිබේ.

නරක අතට හැරෙමින් තිබෙන ආර්ථික අර්බුදය මධ්‍යයේ වැඩකරන ජනතාවගේ ජීවන තත්වයන්ට රුදුරු ප්‍රහාර එල්ල කිරීමේදීත්, දේශපාලන විරුද්ධත්වය මැඩ පැවැත්වීමේදීත් ඒ සඳහා හොඳම දේශපාලන උපකරනය ජෙනරාල් ෆොන්සේකා බව පාලක ප්‍රභූවේ කොටසකට පෙනීගොස් තිබුනි. එක්සත් ජනපදය හා යුරෝපය වෙත යොමුව තිබූ රටේ සම්ප්‍රදායික දිශානතියේ වියදමෙන් රාජපක්ෂ තන්ත්‍රය, ආධාර සඳහා එන්ට එන්ටම චීනය මත වාරුවීමට දරන උත්සාහය පිලිබඳව කනස්සල්ලක් ද ඒ සමඟ ම පැවතුනි.

පෙර දිනයේ ඡන්ද ගනන් කිරීම තවමත් සිදුවේ. ඒ අතර වාරයේ ඡන්ද කොට්ඨාශ තුනෙන් එකක පමන ප්‍රකාශිත ගනන් හිලව් අනුව, රාජපක්ෂ සියයට 59.7 ට 38.5 ක අති විශාල බහුතරයකින් ජයගෙන ඇත. රාජ්‍ය සේවකයන්ට ලබාදෙන ප්‍රකාශිත තැපැල් ඡන්දයෙන් ද බලයේ සිටින පුද්ගලයා කෙරෙහි වැඩි මනාපය පලව තිබේ. මැතිවරන දිනට පෙරාතුව බොහෝ විචාරකයන් අපේක්ෂා කලේ කරට කර තරගයකි.

මැතිවරන ප්‍රචන්ඩ ක්‍රියා නිරීක්ෂන මධ්‍යස්ථානයේ ගනන් බැලීම් අනුව 26 වසරක සිවිල් යුද්ධයෙන් ව්‍යසනයට පත් උතුරු ප්‍රදේශයේ ඡන්ද ප්‍රකාශ කිරීම සියයට 20 ක් පමනි. දෙමල ජනතාවගේ බොහෝ සාමාජිකයන් 2006 දී යලි යුද්ධයට අවතීර්නවූ රාජපක්ෂ හා, මිලිටරි ප්‍රහාරය ගෙන ගිය ෆොන්සේකා අතර තේරීමක් පිලිබඳව සිය පිලිකුල ප්‍රකාශ කලේ සරලව ම ඡන්දය නොදීම ලෙසිනි.

දිවයිනේ අවශේෂ ප්‍රදේශයන්හි ඡන්දය ප්‍රකාශ කිරීම සියයට 80 පමන විය. එහෙත් එකදු අපේක්ෂකයෙක් කෙරෙහි හෝ පැවතියේ මඳ උද්යෝගයකි. එල්ටීටීඊය පරාජය කිරීමෙන් පසුව සාමයේ හා සෞභාග්‍යයේ නව යුගයක් උදාකරන බවට රාජපක්ෂගේ ප්‍රතිඥා කෙසේ වෙතත්, වැඩකරන ජනතාව අතර බොහොමයක් දෙනා පෙන්නුම් කලේ නොකඩවා සිදුවන සිය ජීවන තත්වයන්හි කඩාවැටීමයි. බොහෝ අවස්ථාවල ඔවුහු "අඩු නපුර" යයි තමන් සැලකූ අයට ඡන්දය දුන්හ.

දකුනු කොලඹ ගුරුවරයෙක් ලෝසවෙඅ මෙසේ ප්‍රකාශ කලේය. "විරෝධතා ඡන්දයක් ලෙස මා ෆොන්සේකාට ඡන්දය දුන්නා. මා ජනාධිපති රාජපක්ෂගේ පක්ෂයෙහි දිගු කාලීන ආධාර කරුවෙක්. එහෙත් ඔහුගේ පාලන ක්‍රමෝපායන් සමග අපට එකග වෙන්න බැහැ. පාර්ලිමේන්තුව හා අධිකරනය නොසලකා හරිමින් ඔහු ආඥාදායකයෙක් ලෙස වැඩ කරයි. ඔහුගේ මැතිවරන ව්‍යාපාරය තුල පවා ඔහු ඡන්ද නීති උල්ලංඝනය කලා. ලෝකයේ විශාලතම ඇමති මන්ඩලය ඔහු සතුව තිබුනත්, ඇමතිවරු කිසිදු බලයක් නැති පඹයන් වගේ. ඔහු රට පාලනය කරන්නේ තම සහෝදරයන්ද ඇතුලත් කල්ලියක් මගින්."

මැතිවරන දිනය සලකුනු වූයේ යාපනය නගරයේ බෝම්බ පිපිරීම් ද ඇතුලු ප්‍රචන්ඩ සිදුවීම් ගනනාවකිනි. සිදුවීම් 100 පමන විශේෂයෙන්ම උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල, වාර්තාවී ඇති බව ප්‍රචන්ඩ ක්‍රියා පිලිබඳ ජාතික මධ්‍යස්ථානය තහවුරු කලේය. එය 150 ක් දක්වා නැගිය හැකි බව ද ඔවුහු පැවසූහ. මැතිවරන ව්‍යාපාරය අතරතුර සිදුවූ ඝාතන පහක් ද ඇතුලුව ප්‍රචන්ඩ ක්‍රියා 1000 ක් පමන වාර්තාවී ඇත. බොහොමයක දී ඉලක්කය බවට පත්වූයේ විරුද්ධ පක්ෂ දේශපාලඥයන් හා ඔවුන්ගේ ආධාරකරුවන්ය.

රාජපක්ෂ ආන්ඩුව සිය ප්‍රතිවාදීන් බියගැන්වීම සඳහා රාජ්‍ය යාන්ත්‍රනය යොදාගත් බවට බොහෝ සාක්ෂි ලැබී තිබුනි. 25 වන දින පොලිස් අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව ආයුධ තිබේදැයි සෙවීම සඳහා එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහගේ නිවස සෝදිසි කිරීමට නියෝගයක් ඉල්ලා සිටියේය. එජාප මෙන්ම ජවිපෙ ද සිය පොදු ජනාධිපතිවරන අපේක්ෂකයා ලෙස ජෙනරාල් ෆොන්සේකාට සහාය දැක්වූහ. අධිකරනය පොලිසියේ ඉල්ලීම ප්‍රතික්ෂේප කලේය.

තවත් අවස්ථාවක දී සන්ඩේ ටයිම්ස්, ඩේලි මිරර් හා තවත් පුවත්පත් ප්‍රකාශයට පත්කරන, විජය පුවත්පත් සමූහයේ කාර්යාල සෝදිසි කිරීම සඳහා පොලිසියට අවසර දීම ප්‍රතික්ෂේප කරනු ලැබිනි. විරුද්ධ පක්ෂයට සහයෝගය දෙන ලද ලංකාඊනිව්ස්.කොම් වෙබ් අඩවියේ සංස්කාරක ප්‍රගීත් එක්නැලිගොඩ දින ගනනාවක් තිස්සේ අතුරුදහන්ව සිටියි. පසුගිය සිව් වසර පුරා ආන්ඩු ගැති ඝාතක කල්ලි විසින් අතුරුදහන්කල හෝ මරාදමන ලද සිය ගනනක් දෙනා අතර මාධ්‍යවේදීන් හා මාධ්‍ය සේවකයන් බොහෝ දෙනෙකි.

25 දින සවස යාපනයේදී, ටීඑන්ඒ පාර්ලිමේන්තු මන්ත්‍රී සුරේෂ් ප්‍රේමචන්ද්‍රන්ට පහර දී තිබේ. මැරයෝ ඔහුගේ රියැදුරුගේ නිවසට ද වාහනයට ද අලාභහානි සිදුකලහ. එල්ටීටීඊය පරාජය වන තෙක් එහි හොරනෑව ලෙස කටයුතු කල ටීඑන්ඒ, පසුව ෆොන්සේකාට සහාය දුන්නේය.

ඡන්ද වංචා පිලිබඳ චෝදනා මතුවෙමින් තිබේ. බොහෝ දෙනා, ප්‍රධානකොටම යාපනය අර්ධද්වීපයේ හා අවට දූපත්වල වාසය කරන දෙමල ජනිකයන්ට ඡන්ද කාඩ්පත් නොලැබුන අතර, ජාතික හැඳුනුම්පත් ද නොමැතිවීම නිසා ඡන්දය පාවිච්චි කල නොහැකි විය. අනෙකුත් අයට යුද්ධයෙන් අවතැන්වීම නිසා ලියාපදිංචිවීමේ අවස්ථාව නොලැබුනි.

යුද්ධය අවසන්වීමෙන් පසුව හමුදාව, එල්ටීටීඊය යටතේ පැවති ප්‍රදේශවල ජීවත්වූ දෙමල සිවිල් වැසියන් 280,000 වටලා චෝදනා විරහිතව වව්නියාව නගරය අසල දැවැන්ත සිර කඳවුරු තුල රැඳවූහ. දෙමල ඡන්ද බලාපොරොත්තුවෙන් පසුගිය මාසයේදී රාජපක්ෂ ඔවුන්ට පිටව යාමට නිදහස ඇති බව නිවේදනය කලේය. කෙසේ වෙතත්, ලක්ෂයක් පමන ජනතාව තවමත් කඳවුරු තුල රැඳී සිටිති.

වව්නියා කඳවුරුවල ලියාපදිංචි කර ඇති ඡන්දදායකයන් සංඛ්‍යාව 24,000 ක් පමනකි. කඳවුරු හැරගිය අයගෙන් කිලිනොච්චියේදී සිය ඡන්දය පාවිච්චි කිරීමට හිමිකම් ඇති 8,000 ද ඇතුලුව 16,000 පමන සංඛ්‍යාවක් ඡන්ද අයිතිය ඉල්ලා සිටියහ. කෙසේ වෙතත් බලධාරීන් ප්‍රමානවත් ගමනාගමන පහසුකම් නොසැපයීම නිසා බොහොමයකට කිලිනොච්චිය කරා ගමන්ගත නොහැකි විය. ප්‍රචන්ඩ ක්‍රියා නිරීක්ෂන මධ්‍යස්ථානය සඳහන් කලේ කිලිනොච්චියේ එක් ඡන්ද මධ්‍යස්ථානයකට පස්වරු 4 ට (ඡන්දය දීම අවසන්වන) විනාඩි පහක් තියා පැමිනි 300 පමන පිරිසකට ඡන්දය දීමට ඉඩ නොදුන් බවය.

බොහෝ දෙමල ජනතාව රාජපක්ෂට එරෙහි විරෝධතා ඡන්දයක් ෆොන්සේකාට දීමට බලාපොරොත්තු වූහ. වැල්ලවත්ත ප්‍රදේශයේ අයෙක් ලෝසවෙඅ ප්‍රකාශ කලේ "මා ෆොන්සේකාට ඡන්දය දුන්නා. අපට වෙනසක් අවශ්‍යයි. අතන මෙතන මිනිසුන් ගනනාවක් අත්අඩංගුවට ගෙන ඇති බව මට අසන්නට ලැබුනා. හමුදා මර්දනය නිසා යාපනයේ ජනතාව ඡන්දය වර්ජනය කිරීමට කල්පනා කරනවා. රාජපක්ෂ හා ෆොන්සේකා යන අපේක්ෂකයන් දෙදෙනාම සොරුන් ලෙස අපට පිලිගැනීමට සිදුවෙනවා. අප කල යුත්තේ කුමක් ද?"

ෆොන්සේකා අපේක්ෂකයෙක් වශයෙන් නුසුදුස්සෙකු කිරීමට ආන්ඩුව කරන තර්ජනය, කොලඹ දේශපාලන සංස්ථාපිතය තුල පැවතීගෙන යන දේශපාලන කුලල්කාගැනීම පිලිබඳ ආරම්භක වෙඩි මුරයක ස්වභාවය ගෙන තිබේ. පරාජයට පත්වුවහොත් ෆොන්සේකා හා ඔහුගේ ආධාරකරුවන් ප්‍රතිචාර දක්වනු ඇත්තේ, ඡන්ද දූෂන හා ප්‍රචන්ඩත්වයේ පදනම මත ඡන්ද ප්‍රතිපලය ගැන ඔවුන්ගේම නීතිමය අභියෝගය ඉදිරිපත් කිරීම මගිනි. ඉරාන ජනාධිපතිවරනයේදී මෙන්ම ශ්‍රී ලංකාවේදී ද මෙම තත්වය, කොලඹ තුල දේශපාලන බලපෑම සඳහා ප්‍රතිවිරුද්ධ මහා බලවතුන්

අතර වඩාත් පුලුල් එදිරිවාදිකම්වල කලි කලහය තුල පැටලැවෙනු ඇත.

පාලක පැලැන්තියේ කුමන කොටසක් හෝ වැඩකරන ජනතාවගේ අයිතීන් වෙනුවෙන් පෙනී නොසිටිති. සමස්තයක් ලෙසම දේශපාලන පැලැන්තිය රටේ ආර්ථික අර්බුදයේ බර කම්කරු පන්තිය හා මහජනතාව මත පැටවීමේලා ඔවුන්ගේ අධිෂ්ඨානය තුල එක්සත්ව සිටිති.

පහත සඳහන් ලිපි ද කියවන්නඃ

ශ්‍රී ලංකාවේ මැතිවරනය ගැඹුරු දේශපාලන අර්බුදය සඳහා වේදිකාව සකසයි

2010 ජනවාරි 26

2010 ජනාධිපතිවරනයේ සසප මැතිවරන ප්‍රකාශනය

2010 ජනවාරි 4

© www.wsws.org